*සැ. යු.* — 2014.04.04 දින පළ වූ අංක 1,857 දරන ගැසට් පත්‍රයේ I:III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,858 - 2014 අප්‍රේල් මස 11 වැනි සිකුරාදා - 2014.04.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 580 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 583 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 593 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය*** **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මැයි මස 02 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අප්‍රේල් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

579 - B 80829 — 2,875 (2014/04 )
F 1 –

# තනතුරු ඇබෑර්තු

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පන්විල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2014

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පන්විල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘතිපත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් 2014.04.25 දිනට පෙර "ලේකම්, පන්විල ප්‍රාදේශීය සභාව, පන්විල" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ කොටසේ පන්විල ප්‍රාදේශීය සභාවේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු ය. (පන්විල ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, ආදේශක සේවකයින්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.)

| *තනතුර නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්/වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|
| මාර්ග කම්කරු III | 01 | 06/2006 iv - PLI රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 | * අටවන ශ්‍රේණියට (09 වසරට) නියමිත විෂයය නිර්දේශය සම්පූර්ණ කර තිබිය යුතුයි. |
| රියදුරු III පන්තිය | 02 | 06/2006 iv - PL 3 - රු. 12,470 - 130 x 10 - 145 x 10 - 160 x 10 - 170 x 12 - රු.18,860 | * දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග විෂයයන් හයකින් සාමාර්ථ ලබා ගැනීම<br><br>* මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද රිය පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍ර (මෝටර් කෝච් -බර වාහන රියදුරු බලපත්‍රය);<br><br>හෝ<br><br>C - ලොරි<br>C1-බහු කාර්ය වාහන<br>D-බස්<br>D1- වෑන්<br>G-ට්‍රැක්ටර්<br>පැදවීමේ නිපුනතාවය පිළිබඳ බලපත්‍රයක් ලබා තිබීම;<br><br>හා<br><br>* දිවා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් යෝග්‍ය තත්ත්වයෙන් සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br>* අවම උස අඩි 5 අඟල් 2 1/2 ක් විය යුතු ය.<br>* මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය. |
| පුස්තකාල සහායක III | 01 | 06/2006 iv PLI- 2006A රු. 11,730 - 10 x 120 10 x 130 - 10 x 145 x 12 x 160 - රු. 17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |

02. *බඳවා ගැනීම සඳහා වූ පොදු කොන්දේසි :*

1. අයදුම්කරු ශ්‍රී ලාංකිකයකු විය යුතු ය.
2. අයදුම්කරුවන් පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය.
3. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍යකින් යුක්ත විය යුතු ය.
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු : 18 ට නොඅඩු හා අඩු 45 නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින්ට උපරිම වයස අදාළ නොවේ.)
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ රජයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතු ය.
6. දැනටමත් පන්විල ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කෙරේ.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

1. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල අනුව බඳවා ගැනීම කරනු ලැබේ.
2. රියදුරු තනතුර සඳහා බඳවා ගනු ලැබීමට දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙක්, පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. ලිඛිත පරීක්ෂණයක් ද පවත්වනු ලබන අතර එම පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

04. *සේවා නියුක්ත කරලීමේ කොන්දේසි :-*

1. මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතයි. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුයි.
2. පත්වීම් දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් වේ.
3. මෙම බඳවා ගැනීමේ කොන්දේසි වලට අමතරව ආයතන සංග්‍රහය මුදල් රෙගුලාසි සහ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන නියෝග වලට ද, මධ්‍යම පළාත් සභාව හෝ පළාත් පාලන කොමසාරිස් සහ පන්විල ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලට අනුකූලව කටයුතු කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතුය.
4. මෙම බඳවා ගැනීමේ නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද පන්විල ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.
5. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
6. ප්‍රමාණවත් ඇපයක් මුදලින් හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයකින් ගෙවන ලෙසට නියම කළ හොත් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතුය.
7. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳව අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය පන්විල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

05. *ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන :*

අයදුම්පත් සමග පහත සඳහන් සහතික වල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්
ii. අධ්‍යාපන සහතික වල ඡායා පිටපත්
iii. පදිංචිය සනාථ කිරීමේ සහතිකය
iv. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරි වරයාගෙන් විය යුතුය)
v. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික

දෙමළ හා ඉංග්‍රීසි පරිවර්ථන වල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමඛ කොට ගත යුතුය.

ලේකම්,
පන්විල ප්‍රාදේශී සභාව,
පන්විල.

2014 මාර්තු මස 24 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

***පන්විල ප්‍රාදේශීය සභාව***

**...................................................................... *තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. මුලකුරු සමග නම :—————————————— .
   මුලකුරු වලින් හැඳින්වෙන නම් :—————————————— .

2. ස්ථිර පදිංචි ලිපිනය :—————————————— .

3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————————————— .

4. ස්ත්‍රී/පුරුෂ භාවය:—————————————— .

5. උපන් දිනය අවු :————————. මාස :————————. දිනය:————————.

6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ අවු :——————. මාස :——————. දිනය:——————.

7. ජාතික හැඳුනුම්පත් අංකය :————————.

8. විවාහක/අවිවාහක බව :————————.

9. ශ්‍රී ලාංකික පුරවැසියෙකුවන්නේ උප්පත්තියෙන් ද, ලියාපදිංචිවීමෙන් ද යන වග :————————.

10. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල පිටපත් ඇමිණිය යුතුයි) :————————.

අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වර්ෂය:————————. අංකය:————————.

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1 | | 5 | |
| 2 | | 6 | |
| 3 | | 7 | |
| 4 | | 8 | |

11. (1) වෙනත් සුදුසුකම් :————————.

(2) වෘත්තීය සුදුසුකම් :————————.

(3) සේවා පලපුරුද්ද :————————.

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක ද, යන වග :————————.

එම තනතුරට පත් වූ දිනය:————————.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?:————————.

ඉහත සඳහන් තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි.

————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරුව වන........................................... මෙම ආයතනයේ ........................................ වශයෙන් සේවය කරනු ලබයි. ඔහු සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු කිසිම නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශකර ඉදිරිපත් කරමි.

————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————————.

04-299

# පළාත් පාලන නිවේදන

## තවලම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තවලම ප්‍රාදේශීය සභාවේ 2014.02.28 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ දී සම්මත කර ගන්නා ලද යෝජනාව මහජනතාවගේ දැන ගැනීම පිණිස ප්‍රසිද්ධ කරනු ලැබේ. යෝජිත කරුණු සම්බන්ධයෙන් ඉඩම් හිමියන් හෝ ප්‍රදේශවාසීන්ගේ විරෝධතා ඇත්නම් මෙම නිවේදන ගැසට් පත්‍රයේ පළවී දින 14 ක් තුළ දී හේතු ඇතුළත්ව පිටපත් දෙකකින් මා වෙත ඉදිරිපත් කළ යුතු වේ. මෙකී කාලය තුළ විරෝධතාවයක් නොමැති වුවහොත් ඉන් පසු එම මාර්ග ප්‍රාදේශීය සභා මාර්ග ලෙස සලකනු ලබන බවත් මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තවලම ප්‍රාදේශීය සභාවේ 2014.02.28 දින පැවති මහ සභාවේ උපලේඛනයේ සඳහන් මාර්ග නාම ලේඛනය දිග හා පළල ප්‍රමාණයන් සහ මාර්ගයේ ආරම්භය අවසානය අනුව තවලම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති බන්දුල විජේසේකර මැතිතුමාගේ හා තවලම ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී ප්‍රේමසිරි විජේවර්ධන මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

| *අනු . අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාමසේවා වසම* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* | *පළල (KM) (M)* | *දිග (KM) (M)* |
|---|---|---|---|---|---|---|
| 1 | ආයුධගල ලිහිනිගල පාර | ඇල ඉහල | ප්‍රධාන මාර්ගය | තිලකරත්නගේ ඉඩම | 3.65 | 04 |
| 2. | ආයුධගල අභ්‍යන්තර පාර | ඇල ඉහල | වලංකඩේ අසල | ලිහිනියගල පාර දක්වා | 3.65 | 01 |
| 3. | දුන්හේන ලිහිනිගල යට්ටපාත දක්වා මාර්ගය | ඇල ඉහල | දුන්හේන | යට්ටපාන | 3.65 | 02 |
| 4. | පිටිගල තවලම මාර්ගයේ සිට යට්ටපාත අතුකෝරළ කඩය නෙළුව පාර දක්වා මාර්ගය | ඇල ඉහල | තවලම මාර්ගය | නෙළුව පාර | 3.65 | 06 |
| 5. | ඇල ඉහළ යට්ටපාත මාර්ගයේ සිට පැලවත්ත 12 කණුව දක්වා මාර්ගය | ඇල ඉහල | ඇල ඉහල යට්ටපාත | පැලවත්ත 12 කණුව දක්වා | 3.65 | 05 |
| 6. | පැලවත්ත නෙළුව පාරේ සිට තවලම කන්ද හරහා ඇල ඉහළ 12 කණුව පාර | ඇල ඉහල | පැලවත්ත නෙළුව පාර | ඇල ඉහළ 12 කණුව පාර | 3.65 | 04 |
| 7. | ඉබ්බවිල හරහා යට්ටපාත ආසන්න පාර ප්‍රධාන මාර්ගය දක්වා පාර | ඇල ඉහල | ඉබ්බවිල හරහා | ප්‍රධාන මාර්ගය දක්වා | 3.65 | 03 |
| 8. | ඇල ඉහළ 12 කණුව පාරේ සිට සමඟි මාවත යට්ටපාත දක්වා මාර්ගය | ඇල ඉහල | ඇල ඉහල 12 කණුව | යට්ටපාන | 3.65 | 03 |
| 9. | ඉන්දල මැටිය පාලම අසල සිට තන්මෝදර මැටිවලදෙනිය පාර ඉබ්බවිල දක්වා පාර | ඇල ඉහල | ඉන්දල වැටිය පාලම අසල සිට | මැටිවල දෙනිය ඉබ්බවිල දක්වා | 3.65 | 04 |
| 10. | තවලම පිටිගල මාර්ගයේ සිට බංගලා කන්ද පාර විමලසේන මහතාගේ නිවස අසලින් ඉහලට යන පාර | ඇල ඉහල | තවලම පිටිගල මාර්ගය | බංගලාකන්ද පාර | 3.65 | 03 |
| 11. | තවලම පිටිගල මාර්ගයේ ආරන්‍ය පාරේ සිට බටුවැන් ගුලන කන්ද පාර | ඇල ඉහල | තවලම පිටිගල ආරන්‍ය පාර | බටුවැන්ගුලන කන්ද පාර | 3.65 | 03 |

| *අනු . අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාමසේවා වසම* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* | *පළල (KM) (M)* | *දිග (KM) (M)* |
|---|---|---|---|---|---|---|
| 12. | දුන්හේන හබරකඩ වත්ත පාරේ සිට නාවලහේන හරහා හල්ලකන්ද මාර්ගය | ඇල ඉහල | දුන්හේන හබරකඩ වත්ත | හල්ලකන්ද මාර්ගය | 3.65 | 03 |
| 13. | මොරවක වත්ත සුසිල් මහතාගේ නිවස අසල සිට සුදුවැල්ලෑව දුන්හේන මාර්ගය | ඇල ඉහල | මොරවක වත්ත සුනිල් මහතාගේ නිවස | සුදුවැල්ලෑව දුන්හේන මාර්ගය | 3.65 | 04 |
| 14. | 12 කණුව පාරේ සිට නෙළුව මණ්ඩල පුර පාර දක්වා පාර | ඇල ඉහල උතුර | 12 කණුව | නෙළුව මණ්ඩලපුර පාර දක්වා | 3.65 | 05 |
| 15. | මණ්ඩලපුර 4 පියවර හරහා මණ්ඩලපුර ඉබ්බවිල 91 පාර | ඇල ඉහල උතුර | මණ්ඩලපුර 4 පියවර | මණ්ඩලපුර ඉබ්බවිල 91 පාර | 3.65 | 06 |
| 16. | මණ්ඩලපුර පාසල අසල සිට ඉබ්බවිල හරහා ඉබ්බවිල පාලම දක්වා පාර | ඇල ඉහල උතුර | මණ්ඩලපුර පාසල අසල සිට | ඉබ්බවිල පාලම දක්වා | 3.65 | 04 |
| 17. | ඉබ්බවිල පාරේ කැඩිච්ච බෝක්කුව අසල සිට කළුගල පාර | ඇල ඉහල උතුර | ඉබ්බවිල පාරේ කැඩිච්ච බෝක්කුව | කළුගල පාර | 3.65 | 03 |
| 18. | මණ්ඩලපුර පාසල අසල සිට කුඹුරේගොඩ පාර | ඇල ඉහල උතුර | මණ්ඩලපුර පාසල අසල සිට | කුඹුරේගොඩ පාර | 3.65 | 06 |
| 19. | පනන්ගල යුනිටි තේ කම්හල අසලින් ආරම්භ වී K. D. De. S ජයසේකර මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය | පනන්ගල නැගෙනහිර | යුනිටි තේ කම්හල අසල | K. D. De. S. ජයසේකර මහතාගේ නිවස | 3.65 | 200m |
| 20. | තවලම ජෙස්මින්වැලි බීරිය දොල පාලම අසල සිට තලංගලු ඇල හරහා පොලොන්ඕවිට, තවලම උප තැපැල් කාර්යාලය, දක්වා පාර | තවලම උතුර | ජෙස්මින්වැලි ආදාහනාගාරය ඉදිරිපිට | තවලම උප තැපැල් කාර්යාලය | 6.00 | 1.00 |
| 21. | තවලම තේ ශක්ති තේ කම්හල සිට පොලොන් ඕවිට ඩබ්ලිව්. වී. කරුණාරත්න මහතාගේ නිවස දක්වා පාර | තවලම උතුර | තේ ශක්ති තේ කම්හල අසලින් | ඩබ්ලිව්. වී කරුණාරත්න මහතාගේ නිවස | 3.65 | 250m |
| 22. | ඕපාත හික්ගහවත්තේ සිට ඇල්ගිරිය ගෙදර දක්වා පාර | ඕපාත උතුර | හික්ගහවත්ත | ඇල්ගිරිය ගෙදර | 3.00 | 1.60 |
| 23. | ඕපාත පැලවත්තේ සිට ඕකදුහේන දක්වා පාර හෙවත් හල්ගහවල පාර | ඕපාත උතුර | ඕපාත පැලවත්ත | ඕකදුහේන | 4.00 | 5.00 |
| 24. | ඕපාත හික්ගහවත්තේ සිට අංකුඩුවල හරහා අස්මගොඩ දක්වා පාර | ඕපාත බටහිර | හික්ගහවත්ත | අස්මගොඩ | 3.00 | 3.00 |

| අනු . අංකය | මාර්ගයේ නම | ග්‍රාමසේවා වසම | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය | පළල (KM) (M) | දිග (KM) (M) |
|---|---|---|---|---|---|---|
| 25. | ඕපාත ගොවිජන සේවා මධ්‍යස්ථානයේ සිට පීල්ලහේන මාර්ගය | ඕපාත බටහිර | ගොවිජන සේවා කාර්යාලය | පීල්ලහේන | 3.00 | 1.00 |
| 26. | ඕපාත අක්කර සීය ජනපද පාර | ඕපාත බටහිර | හල්ගහවෙල | ජනපද පාර | 4.00 | 0.60 |
| 27. | ඕපාත අක්කර සීය අන්නාසිගල මාර්ගය | ඕපාත බටහිර | හල්ගහවෙල | අන්නාසිගල මාර්ගය | 4.00 | 1.60 |
| 28. | ඕපාත සේනානායක මාවතේ සිට පොල්ගහවෙල දක්වා මාර්ගය | ඕපාත බටහිර | සේනානායක මාවත | පොල්ගහවල දක්වා | 4.00 | 1.50 |
| 29. | ඕපාත හල්ගහවෙල සිට අක්කර සීය පාර | ඕපාත දකුණ | හල්ගහවල | අක්කර සීය | 3.00 | 3.00 |
| 30. | ඕපාත කංකානම්ගෙදර වත්තේ සිට කඩේ වත්ත ප්‍රධාන පාර දක්වා මාර්ගය | ඕපාත නැගෙනහිර | කංකානම්ගෙදර වත්ත | ප්‍රධාන පාර | 4.00 | 0.65 |
| 31. | ඕපාත ගුරුබැවුල ජී. ඩබ්. ඩී. පාරේ සිට 12 කණුව ජී. ඩබ්. ඩී. පාර දක්වා මාර්ගය | ඕපාත නැගෙනහිර | ගුරබැවුල | 12 කණුව ප්‍රධාන පාර මාර්ගය | 4.00 | 1.80 |
| 32. | ඕපාත ඇටඹගහවිල රවුම් පාර | ඕපාත නැගෙනහිර | ඇටඹගහවිල | | 4.00 | 0.80 |

04-245

---

**බිංගිරිය ප්‍රාදේශීය සභාව**

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ 11 පරිච්ඡේදයේ 5(1) යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ II වැනි උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන භූමි පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂය භාර අමාත්‍ය වන ජේ. පී. දයාසිරි පත්මකුමාර ජයසේකර වන මා විසින් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයන්හි සඳහන් සුසාන මලමිනී වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසාන ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ජේ. පී. දයාසිරි පත්මකුමාර ජයසේකර,
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය
වයඹ පළාත් සභාව.

2014 පෙබරවාරි මස 26 වැනි දින,
කුරුණෑගල ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

## බිංගිරිය ප්‍රාදේශීය සභාව

### *උපලේඛනය I*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර පානවැව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පානවැව ගමෙහි අ.ග.පි. 1451 පත්‍ර 01 හි කෝන්ගහහේන නැමැති ඉඩමේ කැබලි අංක 49.

ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරී වසම :- 1464 පානවැව
ගම :- පාන වැව
ඉඩමේ නම :- කෝන්ගහහේන
මායිම් :-
උතුරට - රක්ෂිත ඉඩම
නැගෙනහිරට
දකුණට අංක 47 දරන බිම් කට්ටිය
බටහිරට - පාර දිගටම ඇති රක්ෂිතය
ඉඩමේ ප්‍රමාණය :- රූ. 03, පර්.36ක් වූ භූමිය

### *උපලේඛනය II*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර කරව්වැව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කරව්වැව ගමෙහි අ.ග.පි. 2003 පත්‍ර 12-1 හි කරව්වැව මිනීපිටිය නැමැති ඉඩමේ කැබලි අංක 47

ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරී වසම :- 1477 කදුරුවැව
ගම :- කරව්වැව
ඉඩමේ නම :- කරව්වැව මිනීපිටිය
මායිම් :-

උතුරට - ලොට් අංක 18
නැගෙනහිරට - T.P.396974
දකුණට - රක්ෂිතය සහ T.P 396946
බටහිරට - ලොට් අංක 18ඒ

ඉඩමේ ප්‍රමාණය :- රූ.1 පර්චස් 37ක් වූ භූමිය

### *උපලේඛනය III*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර ඉ/කඩිගමුව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉ/කඩිගමුව ගමෙහි අ.ග.පි. 2139 පත්‍ර I 12-2 හි මිනී පිටිය නැමැති ඉඩමේ කැබලි අංක 105.

ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරී වසම :- 1480/ඉ/කඩිගමුව
ගම :- ඉ/කඩිගමුව
ඉඩමේ නම :- මිනීපිටිය
මායිම් -
උතුරට - T.P.395611
නැගෙනහිරට - T.P.419097
දකුණට - 419097 දරන ඉඩම
බටහිරට - පාර
ඉඩමේ ප්‍රමාණය :- රූ.1 පර්චස් 37ක් වූ භූමිය

### *උපලේඛනය IV*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වන පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර ගැටුලාව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගැටුලාව ගමෙහි අ.ග.පි. 1398 පත්‍ර 1 හි මිනීපිටිය නැමැති ඉඩමේ කැබලි අංක 26.

උපලේඛනය

ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- බිංගිරිය
ග්‍රාම නිලධාරී වසම :- 1456 ගැටුලාව
ගම :- ගැටුලාව
ඉඩමේ නම :- මිනීපිටිය
මායිම් -
උතුරට - කැබලි අංක 28ඩී සහ 28 එල්
නැගෙනහිරට - කැබලි අංක 28 එල්
දකුණට - කැබලි අංක 29
බටහිරට - කැබලි අංක 8ඩී සහ 28එල්

ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.089ක් වූ ඉඩම

*උපලේඛනය V*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර ඉ/තලම්පොල සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉ/තලම්පොල ගමෙහි අග.පි. 1389 පත්‍ර 19 හි පින්කුඹුරහේන සහ සුසාන භූමිය නැමැති ඉඩමේ කැබලි අංක 105.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාශය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1448 ඉ/කෝන්කදවල
ගම :- ඉ/තලම්පොල
ඉඩමේ නම :- පින්කුඹුරහේන සහ සුසාන භූමිය
මායිම් -
උතුරට - කැබලි අංක 104
නැගෙනහිරට - කබැලි අංක 104 සහ අ.ග.පි. 1386 ගම් මායිම සහ 106
දකුණට - අ.ග.පි. 1386 කිරින්දේගම ගම් මායිම සහ කැබලි අංක 106
බටහිරට - කැබලි අංක 97
ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.219ක් වූ භූමිය

*උපලේඛනය VI*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර හබවැව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හබවැව ගමෙහි අ.ග.පි. 1460 පත්‍ර 01 හි තිඹිරිගහකොටුව නැමැති ඉඩමේ කබැලි අංක 07

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාශය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1438 කුඩකලව
ගම :- හඹවැව
ඉඩමේ නම :- තිඹිරිගහකොටුව
මායිම් -
උතුරට - කැබලි අංක 06
නැගෙනහිරට - කබැලි අංක 06ජ් සහ මහා මාර්ගය
දකුණට - 06ජ් සහ 06 ද
බටහිරට - අ.ග.පි. 1461 හල්මිල්ලෑව ගම් මායිමද කබැලි අංක 7
ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.132 ක් වූ භූමිය

*උපලේඛනය VII*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර හල්මිල්ලවැව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හල්මිල්ලවැව ගමෙහි අ.ග.පි. 1461 පත්‍ර 01 හි කෝන්ගහකොටුව නැමැති ඉඩමේ කැබලි අංක 03.

උපලේඛනය

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාශය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1438 කුඩකලව
ගම :- හල්මිල්ලවැව
ඉඩමේ නම :- කෝන්ගහකොටුව
මායිම් -
උතුරට - කැබලි අංක 01එච්
නැගෙනහිරට - කැබැලි අංක හඹවැව
දකුණට - කැබලි අංක මාර්ගය
බටහිරට - කැබලි අංක 01අයි සහ 01එච්
ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.114ක් වූ භූමිය

*උපලේඛනය VIII*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වන පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර පානවැව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කහවල ගමෙහි අ.ග.පි. 2014 පත්‍ර 01 හි පලුගහපිටිය නමැති ඉඩමේ කැබැලි අංක 04.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාශය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1468 වැල්ලරාව
ගම :- කහවල
ඉඩමේ නම :- පලුගහපිටිය
මායිම් -
උතුරට - කැබලි අංක 01
නැගෙනහිරට - කැබැලි අංක 05
දකුණට - 06 සහ 03 ද
බටහිරට - කැබලි අංක 03 සහ 02
ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.239 ක් වූ භූමිය.

### *උපලේඛනය IX*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර ඉ/කරඹේ සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉ/කරඹේ ගමෙහි අ.ග.පි. 1409 පත්‍ර 03 හි හීන්මොරගොල්ල කැලේ නැමැති ඉඩමේ කැබලි අංක 03 කේ.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1442 කෝසාගම
ගම :- ඉ/කරඹේ
ඉඩමේ නම :- හීන්මොරගොල්ල කැලේ
මායිම් -
උතුරට - කැබලි අංක 03 ඒ
නැගෙනහිරට - කැබැලි අංක 03
දකුණට - 03එෆ්
බටහිරට - කැබලි අංක 03එෆ්
ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.227ක් වූ භූමිය

### *උපලේඛනය X*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර කෝන්වැටිය සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කෝන්වැටිය ගමෙහි අ.ග.පි. 2126 පත්‍ර 01 හි කෝන්වැටිය සහ සුසාන භූමිය නමැති ඉඩමේ කැබලි අංක 11.
ඉඩම පිහිටි ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1437 මෙලදෙණිය
ගම :- කෝන්වැටිය
ඉඩමේ නම :- කෝන්ගහමුල මිනීපිටිය
මායිම් -
උතුරට - කැබලි අංක 6සී සහ 6ඒ සහ 12
නැගෙනහිරට - කැබැලි අංක 12 සහ අ.ග.පි. 2125 මෙලදෙණිය ගම්මානය
දකුණට - කැබලි අංක අ.ග.පි. 2125 මෙලදෙණිය ගම්මානය
බටහිරට - කැබලි අංක 08

ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.220 ක් වූ භූමිය

### *උපලේඛනය XI*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර බක්මීරුප්ප සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බක්මීරුප්ප ගමෙහි අ.ග.පි. 2012 පත්‍ර 02 හි මිල්ලගහහේන නැමැති ඉඩමේ කැබලි අංක 67.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1469 බක්මීරුප්ප
ගම :- බක්මීරුප්ප
ඉඩමේ නම :- මිල්ලගහහේන
මායිම් -
උතුරට - කැබලි අංක 66
නැගෙනහිරට - කැබැලි අංක 65 සහ 68
දකුණට - කැබලි අංක 78
බටහිරට - කැබලි අංක 62 සහ 66
ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.417 ක් වූ භූමිය

### *උපලේඛනය XII*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර ප/තලම්පොල සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප/තලම්පොල ගමෙහි අ.ග.පි. 1392 පත්‍ර 10 හි වැවගාව හේන්යාව නැමැති ඉඩමේ කැබලි අංක 24.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1446 ප/තලම්පොල
ගම :- ප/තලම්පොල
ඉඩමේ නම :- වැවගාව හේන්යාය
මායිම් -
උතුරට - කැබලි අංක 50
නැගෙනහිරට - කැබැලි අංක 162
දකුණට - කැබලි අංක 162
බටහිරට - කැබලි අංක 163

ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.223 ක් වූ භූමිය

### *උපලේඛනය XIII*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර මකුල්ලපොකුණ සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මකුල්ලපොකුණ ගමෙහි අ.ග.පි. 1402 පත්‍ර 02 හි මකුල්ලපොකුණ සුසානභූමිය නැමැති ඉඩමේ කැබලි අංක 19 I 02.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1446 පහළ තලම්පොල
ගම :- මකුල්ලපොකුණ
ඉඩමේ නම :- මිනීපිටිය
මායිම් -
උතුරට - කැබලි අංක 19 I
නැගෙනහිරට - කැබැලි අංක 19 I, 19 I3, 19 I
දකුණට - කැබලි අංක 19 I
බටහිරට - කැබලි අංක 19 I

ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.215 ක් වූ භූමිය

*උපලේඛනය XIV*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වන පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර මඩිගේ වෙල්ලන්ගිරිය සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මඩිගේ වෙල්ලන්ගිරිය ගමෙහි අ.ග.පි. 1394 පත්‍ර 01 හි මිනීපිටිය නැමැති ඉඩමේ කැබලි අංක 77ඒ.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1456 ගැටුලාව
ගම :- මඩිගේ වෙල්ලන්ගිරිය
ඉඩමේ නම :- මිනීපිටිය
මායිම් -
උතුරට - කැබලි අංක 60 සහ 62
නැගෙනහිරට - කැබැලි අංක 60
දකුණට - කැබලි අංක 60
බටහිරට - කැබලි අංක 60

ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.152ක් වූ භූමිය

*උපලේඛනය XV*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර ඉ/හීන්පන්නාව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉ/හීන්පන්නාව ගමෙහි අ.ග.පි. 2140 පත්‍ර 01 හි මිනීපිටිය නැමැති ඉඩමේ කැබලි අංක 04ඒ.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1481 හීන්පන්නාව
ගම :- ඉ/හීන්පන්නාව
ඉඩමේ නම :- මිනීපිටිය
මායිම් -
උතුරට - කැබලි අංක 04සී
නැගෙනහිරට - කැබැලි අංක 04සී
දකුණට - කැබලි අංක 04බී
බටහිරට - කැබලි අංක 03 සහ 02
ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0..225ක් වූ භූමිය

*උපලේඛනය XVI*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර දන්විල සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දන්විල ගමෙහි අ.ග.පි. 1405 පත්‍ර 1 හි මිනීපිටිය නැමැති ඉඩමේ කැබලි අංක 25.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1445 වීරපොකුණ
ගම :- දන්විල
ඉඩමේ නම :- මිනීපිටිය
මායිම් -
උතුරට - කැබලි අංක 28
නැගෙනහිරට - කැබැලි අංක 28 සහ ප්‍රාදේශීය සභා මාර්ගය
දකුණට - ප්‍රාදේශීය සභා මාර්ගය සහ වීරපොකුණ ගම් මායිම 1406
බටහිරට - වීරපොකුණ ගම් මායිම අ.ග.පි. 1406 සහ 28

ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.223 ක් වූ භූමිය

*උපලේඛනය XVII*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර බන්ඩාරිගල්ගොඩ සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බන්ඩාරිගල්ගොඩ ගමෙහි අ.ග.පි. 1382 පත්‍ර 1 හි මිනීපිටිය නැමැති ඉඩමේ කැබලි අංක 01 එෆ්.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරි වසම :- 1444 බන්ඩාරිගල්ගොඩ
ගම :- බන්ඩාරිගල්ගොඩ
ඉඩමේ නම :- මිනීපිටිය
මායිම් -
උතුරට - කැබලි අංක 144
නැගෙනහිරට - කැබැලි අංක 144 සහ ප්‍රාදේශීය සභා මාර්ගය
දකුණට - කැබලි අංක 144 සහ ප්‍රාදේශීය සභා මාර්ගය
බටහිරට - කැබලි අංක 144

ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.245 ක් වූ භූමිය

*උපලේඛනය XVIII*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර කොස්ගහගොඩ සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොස්ගහගොඩ ගමෙහි අ.ග.පි. 1379 පත්‍ර 16 හි පොකුණගොඩගාව මූකලාන නැමැති ඉඩමේ කැබලි අංක 103.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරී වසම :- 1443 මානලෙම්බුව
ගම :- කොස්ගහගොඩ
ඉඩමේ නම :- පොකුණගොඩගාව මූකලාන
මායිම් -
උතුරට - අ.ග.පි. 1594 දංවිල
නැගෙනහිරට - කැබැලි අංක 46 1/3
දකුණට - කැබලි අංක 104
බටහිරට - කැබලි අංක 104 සහ දංවිල වසම

ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.315 ක් වූ භූමිය

## *උපලේඛනය XIX*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වන පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර ප/කෝන්කදවල සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප/කෝන්කදවල ගමෙහි අ.ග.පි. 1387 පත්‍ර 9 හි ගොමුවැවහේන්යාය නැමැති ඉඩමේ කැබලි අංක 89.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරී වසම :- 1448 ඉ/කෝන්කදවල
ගම :- ප/කෝන්කදවල
ඉඩමේ නම :- ගොමුවැවහේන්යාය
මායිම් -
උතුරට - කැබලි අංක 83
නැගෙනහිරට - කැබැලි අංක 83
දකුණට - කැබලි අංක 90 සහ 21
බටහිරට - කැබලි අංක 21 සහ 88

ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.357 ක් වූ භූමිය

## *උපලේඛනය XX*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වන පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර වල්ලව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වල්ලව ගමෙහි අ.ග.පි. 2104 පත්‍ර 03 හි කරඹයායේ මිනීපිටිය නැමැති ඉඩමේ කැබලි අංක 51.

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරී වසම :- 1429 කෝන්කඩවල
ගම :- වල්ලව
ඉඩමේ නම :- කරඹයායේ මිනීපිටිය
මායිම් -

උතුරට - කැබලි අංක 50 සහ 1බී.ඒ.
නැගෙනහිරට - කැබැලි අංක 1 බී.ඒ.
දකුණට - කැබලි අංක 1
බටහිරට - කැබලි අංක 1

ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.137 ක් වූ භූමිය

## *උපලේඛනය XXI*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වන පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර ඌරපොත්ත සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඌරපොත්ත ගමෙහි අ.ග.පි. 1424 පත්‍ර 03 හි අයියන් පෙරුමාගාර නමැති ඉඩමේ කැබලි අංක 18F[1]

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරී වසම :- 1458 ඌරපොත්ත
ගම :- ඌරපොත්ත
ඉඩමේ නම :- අයියන් පෙරුමාගාර
මායිම් -
උතුරට - කැබලි අංක 18සී
නැගෙනහිරට - කැබැලි අංක 18එෆ්
දකුණට - කැබලි අංක 18එෆ්
බටහිරට - කැබලි අංක 18එෆ් [2]
ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.402 ක් වූ භූමිය

## *උපලේඛනය XXII*

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වන පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර වැල්ලරාව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම.

බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැල්ලරාව ගමෙහි අ.ග.පි. 2011 පත්‍ර 11 හි මිනීපිටිය නැමැති ඉඩමේ කැබලි අංක 42

ඉඩම පිහිටි ප්‍රාදේශීය
ලේකම් කොට්ඨාසය :- බිංගිරිය
ග්‍රාම නිලධාරී වසම :- වැල්ලරාව (1468)
ගම :- වැල්ලරාව
ඉඩමේ නම :- මිනීපිටිය (වැල්ලරාව)
මායිම් -
උතුරට - කැබලි අංක 41
නැගෙනහිරට - කැබැලි අංක 44
දකුණට - කැබලි අංක 41
බටහිරට - කැබලි අංක 43
ඉඩමේ ප්‍රමාණය :- හෙක්ටයාර් 0.703 ක් වූ භූමිය

04-265

## ලුණුගල ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත

261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 03 වන වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2014 ජනවාරි මස 28 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආනන්ද එම්. ටී. කේ. ද සිල්වා,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 21 වැනි දින,

### 01 වැනි යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියැවෙන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.11.02 අංක 1678/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

### 02 වන යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියැවෙන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2012.10.05 අංක 1778/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

### 03 වන යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියැවෙන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.01.22 අංක 1794/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ, ප්‍රජා මූල සංවිධාන විසින් කළමනාකරණය කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්තිය ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

### 04 වැනි යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියැවෙන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ, සම්මත අතුරු ව්‍යවස්ථා 23ක් මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

04-375

---

## අගලවත්ත ප්‍රාදේශීය සභාව

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ සභා සම්මුතියට අනුව මාර්ග නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී. 1975 හි අංක 4 දරන, වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනතේ විධිවිධාන පරිදි බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාර්ග සඳහා මාර්ග නාමයන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් දන්වමි.

ඒ. ආර්. පොතුවිල,
ලේකම්,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 21 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

**අගලවත්ත ප්‍රාදේශීය සභාව**

*මාර්ග ලේඛනය*

| පැරණි මාර්ග නාමය | භාවිතා කළ යුතු නාමය | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය |
|---|---|---|---|
| පොල්ගම්පල මිල්ලකුඹුර මාර්ගය | ඩැනී ගුණසිංහ මාවත | රත්මලේ පොල්ගම්පල මාර්ගය | කරවිට මහතාගේ නිවස අසලින් |
| ගොරකගොඩ බැමිනිවියාගොඩ මාර්ගය | ඩී. ඕ. වීරකෝන් මාවත | ගොරොක්ගොඩ මාර්ගය | ජයතිස්ස මහතාගේ නිවස |
| පින්නගොඩ මානාභරණ මාර්ගය | ජේ. ඒ. ඩී. පියසේන මාවත | ඩාර්ටන්ෆීල්ඩ් පාර | පින්නගොඩ මුලටියන පාර |

04-393

---

**අගලවත්ත ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (අ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (අ) වැනි වගන්තිය ප්‍රකාර බස්නාහිර පළාත් සභාවේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ප්‍රාදේශීය සභාව විසින් මේ සමග ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත් අගලවත්ත ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම නිවේදනය අංක 1839, 2013.11.29 දිනැති *ගැසට් පත්‍රයේ* පළවී ඇති අතර, එම කාලසීමාව තුළ කිසිදු විරුද්ධත්වයක් ඉදිරිපත් වී නොමැති හෙයින් මෙම උපලේඛනයේ සඳහන් මංමාවත් අගලවත්ත ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බවට *ගැසට් පත්‍රයේ* පළ කරන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඒ. ආර්. පොතුවිල,
ලේකම්,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 21 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

*අගලවත්ත ප්‍රාදේශීය සභාව*

*මාර්ග ලේඛනය*

| අනු. අංකය | මාර්ගයේ නම | දිග කි. මී. | පළල මීටර් |
|---|---|---|---|
| 01 | එම්. ඒ. රේණුකා මල්කාන්ති මියගේ නිවස අසලින් ආරම්භ වන සුජීව මහතාගේ නිවස අසලින් අවසන් වන ඉද්දගොඩ පල්ලවත්ත පාර | 0.477 | 4.25 |
| 02 | අගලවත්ත බදුරලිය මාර්ගයේ පනාදඩුකන්ද මාර්ගයෙන් ආරම්භ වන නලින් විතාන මහතාගේ නිවස අසලින් අවසන්වන පනාදඩුකන්ද කුරුඳුවත්ත පාර | 1.0 | 3.65 |
| 03 | රත්මලේ මාර්ගයෙන් ආරම්භ වන කපුගොඩ මාර්ගයෙන් අවසන් වන පොල්ගම්පල දෙකන්හන්දිය පාර | 0.940 | 3.65 |
| 04 | අගලවත්ත පොල්ගම්පල මාර්ගයෙන් ආරම්භ වන සුනිල් ජයන්ත මහතාගේ නිවස අසලින් අවසන් වන පොල්ගම්පල හොක්වත්ත පාර | 0.1 | 3.65 |
| 05 | පොල්ගම්පල වරලත්පිටිය හන්දියේ සිට මීටර් 200ක් පමණ දුරින් වම්පසින් ආරම්භවන පීටර් සමරසිංහ මහතාගේ නිවස අසලින් අවසන් වන පටුමග | 0.061 | 3.05 |
| 06. | මතුගම අගලවත්ත මාර්ගයෙන් ආරම්භ වී සනත් නාකන්දල මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය (සර්වෝදය මාවත) | 0.085 | 6.09 |

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *දිග කි. මී.* | *පළල මීටර්* |
|---|---|---|---|
| 07. | අගලවත්ත මතුගම මාර්ගයේ යටියන සර්වෝදය මාවතෙන් ආරම්භ වී එම්. ඩී. ජයන්ත මහතාගේ නිවස අසලින් අවසන් වන පටුමග | 0.103 | 6.09 |
| 08. | උඩවෙල-හැළඹ පාරේ චන්දන බේකරිය අසලින් ආරම්භ වී ගුණපාල මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය | 0.137 | 3.65 |
| 09. | අගලවත්ත-කලවැල්ලාව මාර්ගයේ කැකුලන්දල බඹරගෙදර පාලම අසල සිට මීටර් 100ක් දුරින් (අගලවත්ත දෙසට) ආරම්භ වන නිශාන්ත මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය | 0.061 | 3.05 |
| 10. | සඳගිරිකන්ද මාර්ගයේ පාසල අසලින් ආරම්භ වන කොළඹ ආරච්චි මහතාගේ ඉඩම අසලින් අවසන් වන මාර්ගය | 0.1 | 3.65 |
| 11. | ඕමත්ත හිදකරල්දොලහේන මාර්ගයේ විදුලි ට්‍රාන්ස්පෝමරය අසලින් ආරම්භ වන හිදකරල්දොල අසලින් අවසන් වන හිදකරල්දොල පාර | 0.1 | 3.65 |
| 12. | ඕමත්ත හිදකරල්දොලහේන මාර්ගයේ ශ්‍රියංගනී මහත්මියගේ ඉඩම අසලින් ආරම්භ වන කැළුම් මහතාගේ නිවස අසලින් අවසන් වන අතුරු මාර්ගය | 0.075 | 3.65 |
| 13. | ඕමත්ත හිදකරල්දොලහේන මාර්ගයෙන් ආරම්භ වන සෝමචන්ද්‍ර මහතාගේ නිවස අසලින් අවසන් වන පුවක්ගහවිට දෙසටවූ මාර්ගය | 0.12 | 3.65 |
| 14. | අගලවත්ත - බදුරලිය මාර්ගයෙන් ආරම්භ වන අමුගොඩවත්ත ඉඩමෙන් අවසන් වන අමුගොඩවත්ත මාර්ගය | 0.137 | 3.05 |
| 15. | හැළඹ මිල්ලගහවත්ත මාර්ගයෙන් ආරම්භ වන පුවක්දොල මුකලාන නොහොත් ඉඹුල්ගොඩවත්ත ඉඩමෙන් අවසන් වන හැළඹ මිල්ලගහවත්ත අතුරු මාර්ගය | 0.289 | 3.65 |

04-394

# විවිධ දැන්වීම්

### දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

### ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන්ගේ නම හා ලිපිනයන් ලියාපදිංචි කිරීම

දෙහිවල ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය තුළ ඇති ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිකරුවන්ගේ නම හා ලිපිනයන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් පහත සඳහන් ගාස්තු සභා තීරණයේ දින සිට අය කිරීමට 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය යටතේ සාදා ඇති අතුරු ව්‍යවස්ථාවල XIX කොටසේ 4 වන වගන්තියෙන් ලැබී ඇති බලතල අනුව 2014.02.07 දින අංක 08(09ආ) 02 දරන සභා සම්මුතිය යටතේ තීරණය කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

ඔප්පු සාරාංශ ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු අයකිරීම -

1. *නේවාසික දේපළ සඳහා :*

    වාර්ෂික වටිනාකම රු. 5,000 දක්වා රු. 2,000
    වාර්ෂික වටිනාකම රු. 5,001 සිට රු. 15,000 දක්වා රු. 3,000
    වාර්ෂික වටිනාකම රු. 15,001 සිට රු. 25,000 දක්වා රු. 4,000
    වාර්ෂික වටිනාකම රු. 25,001 සිට රු. 50,000 දක්වා රු. 5,000
    වාර්ෂික වටිනාකම රු. 50,001 සිට රු. 1,00,000 දක්වා රු. 6,000
    වාර්ෂික වටිනාකම රු. 1,00,001 සිට රු. 2,00,000 දක්වා රු. 7,500
    වාර්ෂික වටිනාකම රු. 2,00,001 සිට ඉහලට රු. 9,000 0

2. *ව්‍යාපාරික දේපල සඳහා :*

    වාර්ෂික වටිනාකම රු. 25,000 දක්වා රු. 4,000
    වාර්ෂික වටිනාකම රු. 25,001 සිට 50,000 දක්වා රු. රු. 5,000
    වාර්ෂික වටිනාකම රු. 50,001 සිට රු. 1,00,000 දක්වා රු. 6,500
    වාර්ෂික වටිනාකම රු. 1,00,001 සිට 2,50,000 දක්වා රු. 8,000
    වාර්ෂික වටිනාකම රු. 2,50,001 සිට 1,000,000 දක්වා රු. 10,000
    වාර්ෂික වටිනාකම රු. 1,000,001 සිට 2,500,000 රු. 12,500
    වාර්ෂික වටිනාකම රු. 2,500,001 සිට ඉහළට රු. 25,000

3. පදිංචිකරු ලෙස නම ඇතුලත් කිරීම සඳහා රු. 300 ක ගාස්තුවක් ගෙවිය යුතුය.

ඉහත ගාස්තුවලට අතිරේකව එකතු කල අගය මත නියමිත බදු මුදල්ද ලිපිගොනු හා ලේඛණ සැකසුම් ගාස්තු ලෙස තැන්පත් මුදලක් වශයෙන් සියළුම දේපල මත වාර්ෂික වටිනාකම රු. 50,000 ක් දක්වා රු. 250 ක් ද, රු. 50,001 ට වැඩි වූ විට රු. 300 ක් ද, රු. 500,000 ට වැඩි වූ විට රු. 400 ක් ද ගෙවිය යුතුය. පදිංචිකරු ලෙස නම ඇතුලත් කිරීම වෙනුවෙන් රු. 200 ක් ගෙවිය යුතුය.

කේ. බී. වී. ඩී. එන්. මුතුගල,
නාගරික කොමසාරිස්,

2014 මාර්තු මස 12 වැනි දින,
නගර සභා කාර්යාලය, දෙහිවල.

04-289

---

## මහනුවර මහ නගර සභාව

### කුණුරොඩු සඳහා ගාස්තුවක් අයකිරීම ප්‍රකාශයට පත්කිරීම

මහනගර සභා ආඥාපනතේ 272 වන ඡේදයේ බලතල ප්‍රකාරව මහනුවර මහ නගර සභාව විසින් වර්ෂ 2002.08.09 වන දින ප්‍රකාශයට පත් කර ඇති අංක 1249 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ xi වන කොටසේ පීඩා වැළැක්වීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන නිවේදනයයි.

වර්ෂ 2013.11.25 වන දින මහනුවර මහ නගර සභාවේ අංක 8(33) දරන සභා සම්මුතිය පරිදි මහ නගර සභා සීමාව තුළ ව්‍යාපාරික ස්ථානවලින් බැහැර කරනු ලබන කුණු රොඩු සඳහා 2014 වර්ෂයේ සිට පහත සඳහන් පරිදි ගාස්තුවක් අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුණු රොඩු යන්නෙන් අළු, දූවිලි අතුගා දමන ද්‍රව්‍ය, කුණු , මලමුත්‍රා, පස්, ගොම, අපවිත්‍ර ද්‍රව්‍ය කසළ හෝ වෙනත් ඉහත දමන ද්‍රව්‍ය අදහස් වේ.

| | |
|---|---|
| කිලෝ 10-15 ප්‍රමාණයෙන් දිනකට ඉවත් කරන ආයතන සඳහා - මසකට | රු. 300 |
| කිලෝ 15-20 ප්‍රමාණයෙන් දිනකට ඉවත් කරන ආයතන සඳහා - මසකට | රු. 400 0 |
| කිලෝ 20-30 ප්‍රමාණයෙන් දිනකට ඉවත් කරන ආයතන සඳහා - මසකට | රු. 600 |
| කිලෝ 30-50 ප්‍රමාණයෙන් දිනකට ඉවත් කරන ආයතන සඳහා - මසකට | රු. 1,000 |
| කිලෝ 50-100 ප්‍රමාණයෙන් දිනකට ඉවත් කරන ආයතන සඳහා - මසකට | රු. 2,000 |
| කිලෝ 100-150 ප්‍රමාණයෙන් දිනකට ඉවත් කරන ආයතන සඳහා - මසකට | රු. 3,000 |
| කිලෝ 150-200 ප්‍රමාණයෙන් දිනකට ඉවත් කරන ආයතන සඳහා - මසකට | රු. 4,000 |
| කිලෝ 200-300 ප්‍රමාණයෙන් දිනකට ඉවත් කරන ආයතන සඳහා - මසකට | රු. 6,000 |
| කිලෝ 300 ට වැඩි ප්‍රමාණයෙන් දිනකට ඉවත් කරන ආයතන සඳහා - මසකට | රු. 7,500 |

මෙම සියලුම ගාස්තු සඳහා වැට් බද්දක් ද ඇතුළත් වන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

චන්දන තෙන්නකෝන්
නාගරික කොමසාරිස්,

2014 වැනි මාර්තු මස 24 වැනි දින,
මහනුවර නාගරික කාර්යාලයේ දී ය.

04-301

---

සංශෝධනයයි

## ගම්පොල නගර සභාව

*2014 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු පැනවීම*

නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 164 හා 165 ආ වගන්ති ප්‍රකාරව පනවන ලද බලපත්‍ර ගාස්තු

අංක 1838 හා 2013.11.22 දින දරන *ගැසට් පත්‍රයේ* IVආ කොටස යටතේ පළ කරන ලද නිවේදනයේ අංක -

15. ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කල, 2013 වසරේ පවත්වාගෙන ගිය හෝටලයක්, ආපනශාලාවක් හෝ ආගන්තුක නිවාසයක් 2014 වසරේ ද පවත්වාගෙන යාම ලෙස පළවී ඇත. 500 0 750 0 1,000 0

එය

15. ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කල, 2013 වසරේ පවත්වාගෙන ගිය හෝටලයක්, ආපනශාලාවක් හෝ ආගන්තුක නිවාසයක් 2014 වසරේ ද පවත්වාගෙන යාම — 2013 වසරේ හෝටලයෙන්, ආපනශාලාවෙන් හෝ ආගන්තුක නිවාසයෙන් ලැබූ පිරිවැටුමෙන් 0.5%ක සමාන මුදලක්

ලෙස නිවැරදි විය යුතුය.

සරත් ගාමිණී හෙට්ටිආරච්චි,
සභාපති,

2014 මාර්තු මස 18 වැනි දින,
ගම්පොල නගර සභාවේ දී ය.
04-247

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.